# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2151/60 - 2019 දෙසැම්බර් මස 01 වැනි ඉරිදා - 2019.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියෝගය මගින් මෙහි උපලේඛනයේ I, II හා III වැනි තීරුවල නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සෑම අනුරූපී භාණ්ඩයක් මතම, ඉහත පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද, 2019 මැයි මස 13 දිනැති අංක 2123/5 දරන අති විශෙෂ ගැසට් නිවේදනය, 2019 ජූලි මස 10 දිනැති අංක 2131/29 දරන අති විශෙෂ ගැසට් නිවේදනය සහ 2019 ඔක්තෝබර් මස 14 දිනැති අංක 2145/12 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත 2019 මාර්තු මස 05 දිනැති අංක 2113/9 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ I වන උපලේඛනයෙහි අනුරූප භාණ්ඩ මත එම උපලේඛනයේ IV වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති බදු අනුප්‍රමාණයන් සඳහා මෙහි උපලේඛනයේ IV වැනි තීරුවෙහි දක්වා ඇති නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2019 දෙසැම්බර් මස 01 දින සිට ප්‍රතිස්ථාපනය විය යුතු බව, ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දීය.


1A - PG 4780 — 567 (2019/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය (I) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (II) | විස්තරය (III) | නිෂ්පාදන බද්ද (IV) |
|---|---|---|---|
| **24.02** | | **දුම්කොළ වලින් හෝ දුම්කොළ ආදේශක වලින් නිෂ්පාදිත සුරුට්ටු, කට තබන පැත්ත උල්වූ සුරුට්ටු, සිගාරිලෝස් සහ සිගරැට්.** | |
| | 2402.20 | දුම්කොළ අඩංගු සිගරැට්: | |
| | 2402.20.20 | දිග මි.මී. 60 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 13,360/- |
| | 2402.20.30 | දිග මි.මී. 60 ට වැඩි නමුත් දිග මි.මී. 67 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 22,300/- |
| | 2402.20.40 | දිග මි.මී. 67 ට වැඩි නමුත් දිග මි.මී. 72 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 37,650/- |
| | 2402.20.50 | දිග මි.මී. 72 ට වැඩි නමුත් දිග මි.මී. 84 ට නොවැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 43,100/- |
| | 2402.20.60 | දිග මි.මී. 84 ට වැඩි සිගරැට් | සිගරැට් 1,000 ට රු. 48,350/- |

12 - 558

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.